ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2009

භාෂා කුසලතා සංවර්ධනය - ESC 1123/1134

කාලය - පැය දෙකයි.

---

දිනය - 2009.06.21 වේලාව - ප.ව. 01.30- ප.ව. 03.30 දක්වා

---

පළමු කොටසින් ප්‍රශ්න දෙකක් (02) ද දෙවන කොටසින් ප්‍රශ්න දෙකක් (02) ද වශයෙන් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

## පළමු කොටස

01. (අ) වයස අවුරුදු 3 - 5 දක්වා ළමයින්ගේ අවධානයෙන් සවන්දීමේ කුසලතා වැඩි දියුණු කිරීමේ වාසි තුනක් (03) ලියන්න.

(ලකුණු 09)

(ආ) පෙර පාසල් ළමයින් තුළ අවධානයෙන් සවන්දීමේ කුසලතාව සංවර්ධනය කිරීම සඳහා ඔබ විසින් සංවිධානය කරනු ලබන එළිමහන් ක්‍රියාකාරකම් දෙකක් (02) පියවරෙන් පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 16)

02. (අ) පෙර පාසල් ළමයා ජීවත්වන සමාජ පරිසරය ඔහු/ඇය ගේ කථනය සංවර්ධනය වීමට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ආ) පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් (02) තෝරාගෙන එමගින් ඔබට පෙර පාසල් ළමයින්ගේ කථනය හා වාග්මාලාව සංවර්ධනය කල හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

1. ළමා කතාන්දර
2. තේරවිලි ගී
3. භූමිකා රංගන
4. පිංතූර කාඩ්පත්

(ලකුණු 16)

03. (අ) පෙර කියවීමේ දක්ෂතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 07)

(ආ) පෙර පාසල් ළමයින් තුළ පෙර කියවීමේ දක්ෂතා සංවර්ධනය කිරීම සඳහා පංති කාමරය තුළ ඔබ සංවිධානය කරන ක්‍රියාකාරකම් තුනක් (03) අවශ්‍ය තැන රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 18)

## දෙවන කොටස

04. පහත සඳහන් මාතෘකා දෙක (02) ගැන කෙටි සටහන් ලියන්න.

ආ) පෙර පාසල් ළමයින්ට කියවීම සඳහා සරල වචන හඳුන්වාදීමේදී ගුරුවරයකු විසින් අනුගමනය කළයුතු පියවර (රූප සටහන් සඳහා ලකුණු ලැබේ.)

(ලකුණු 15)

ආ) සවන්දීමේ හැකියාව පෙර පාසල් ළමයා තුළ වර්ධනය කිරීමට ගත හැකි උපායමාර්ග

(ලකුණු 10)

05. අ) පෙර ලිවීමේ කුසලතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 05)

ආ) පහත සඳහන් ක්‍රියාකාරකම් ඇසුරින් පෙර පාසල් ළමයින්ගේ පෙර ලිවීමේ කුසලතා සංවර්ධනය කළ හැකි ආකාරය අවශ්‍ය තැන රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

- මෝස්තරවලට හුරු කිරීම
- පින්තූරයක හැඩය මතක තබා ගැනීම
- දිශාව පිළිබඳ අදහසක් ඇති කර ගැනීම

(ලකුණු 20)

06. සවන්දීම, කථනය, කියවීම හා ලිවීම යන භාෂා කුසලතා හතර (4) සමෝධානිත වේ. මෙම කියමන විමසන්න.

(ලකුණු 25)

-හිමිකම් ඇව්රිණි. -